කොලොන්නාව නගර සභාව

<u>කොළඹ දිස්ත්‍රික්කය</u>

1. මූල්‍ය ප්‍රකාශන

------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

-----------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 22 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට කොලොන්නාව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) භෞතික පැවැත්ම සනාථ කල නොහැකි රු.1,471,238 ක ලී බඩු හා සවිකිරීම් සහ රු.27,494,904 ක මෝටර් රථ හා කරත්ත ශේෂයන් ගිණුම්වල ඇතුලත්වීම නිසා ස්ථාවර වත්කම් රු.28,966,142 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට ජලාපවාහන මණ්ඩලයට ගෙවිය යුතු රු.47,662,878 ක හිඟ ජල ගාස්තුව මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් නොවීම නිසා ණයහිමියෝ එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) අංක 194100173792765 දරන බැංකු ගිණුමේ 2017 දෙසැම්බර් 31 දිනට මුදල් පොත අනුව ශේෂය රු.190,920ක් වුවත්, ශේෂ පත්‍රයේ රු.52,133 ක් ලෙස දක්වා තිබිම නිසා, ජංගම වත්කම් රු.138,787 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) ලැබිය යුතු වරිපනම් රු.1,328,889 ක් පාලන ගිණුමට ගිණුම්ගත නොකිරීම නිසා ලැබිය යුතු වරිපනම් හා වර්ෂයේ ආදායම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) මූල්‍ය ප්‍රකාශන අනුව පොදු ගබඩා ගිණුමේ ශේෂය රු.38,884,780 ක් වුවද 2017 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව ශේෂය රු.4,521,097 ක් වීම නිසා වත්කම් රු.34,363,683 කින් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.2 අසම්භාව්‍ය බැරකම්

------------------------

සමාලෝචිත වර්ෂය තුළ සභාව විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව පැවරූ නඩු 04ක් අධිකරණයේ විභාග වෙමින් පැවතිය ද, ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල සටහනක් ලෙස හෙළිදරව් කර නොතිබුණි.

1.3.3 නොසැසඳුණු ගිණුම්

විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 04 කට අදාල ශේෂයන් හා උපයෝගී පොත්/උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.42,660,142 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

ලැබිය යුතු ගිණුම් විෂයයන් 03 කට හා ගෙවිය යුතු ගිණුම් විෂයයන් 02කට අදාලව පිළිවෙලින් රු.811,678 ක් හා රු.3,851,124 ක් වශයෙන් එකතුව රු.4,662,802 ක් වූ ශේෂයක් වර්ෂ ගණනාවක සිට නිරවුල් නොකර ඉදිරියට ගෙන එමින් පැවතුණි.

1.3.5 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණතීරණ වලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) නගර සභා ආඥා පනත 170 අ (2) වගන්තිය | 80,650,400 | නගර සභාවට අයවිය යුතු සියළු අයවිම් අයකර ගෙන නගර සභාවේ අරමුදල්වලට බැර කිරීම සඳහා අවශ්‍ය සියළු පියවර ගැනීම සභාවේ ලේකම්ගේ කාර්යය විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන දිනට ලැබිය යුතු හිඟ ආදායම් අයකරගෙන නොතිබුණි. |
| (ආ) 2017 මැයි මස දින රහිත පළාත් පාලන චක්‍රලේඛ අංක LGD/03/2017 | - | පළාත් පාලන ආයතනය විසින් එක්රැස් කරනු ලබන කසළ, ජනනයවන ස්ථානයේදී වර්ග කිරීමට මහජනයා යොමු කරන ලෙස උපදෙස් දී ඇතත් 2017 ජූලි සිට දෙසැම්බර් දක්වා කසළ අංගනයට බැහැර කරන ලද මුළු කසළ ප්‍රමාණයෙන් 88% ක්ම මිශ්‍ර කසළ විය. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| (i) මුදල් රෙගුලාසි 571 | 158,498 | තැන්පත් කළ දින සිට වර්ෂ 02 ක් ඉක්ම වූ තැන්පතු හඳුනාගෙන/ විමසීම්කර ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) 1985 මාර්තු 20 දිනැති ලිපි අංක දෙසැ/01 දරන නාගරික සංවර්ධන | - | බිම් පරිමාණ අනුපාතය ඉක්මවීම, අනවසර ඉදිකිරීම් සහ රථ වාහන නතර කිරීම වෙනුවෙන් අයකරන සේවා |

| | |
|---|---|
| අධිකාරි චක්‍රලේඛය | ගාස්තුවලින් සියයට 25 ක් නාගරික සංවර්ධන අධිකාරියට යවා නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වු ආදායම රු.39,677,933 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.18,999,809 ක් විය.

3.2 මූල්‍ය පාලනය

(අ) මහජන බැංකුව (කොලොන්නාව) ගිණුම් අංක 194100173792765

2017 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව බැංකු ගිණුමේ ශේෂය රු.190,920 ක් ලෙස හා බැංකු ප්‍රකාශනය අනුව එදිනට ශේෂය රු.88,436 ක් ලෙස දක්වා තිබුණි. එම බැංකු සැසඳුම් ප්‍රකාශයේ බැංකු ශේෂයට, වර්ෂ ගණනාවක් තිස්සේ ඉදිරියට ගෙන එමින් පැවති (බැංකු දෝෂ, මුදල් මාරු කිරීම්) රු.172,721ක් එකතුකර තිබුණු අතර රු.70,237ක් එම ශේෂයෙන් අඩුකර තිබුණි. ඉහත ගැලපීම් සනාථ කිරීම සඳහා කිසිදු සාක්ෂියක් විගණනය සඳහා ඉදිරිපත් නොකිරීම හේතුවෙන් පිළියෙල කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශය පිළිගත හැකි තත්ත්වයක නොපැවතුණි.

(ආ) මහජන බැංකුව (කොලොන්නාව) ගිණුම් අංක 194100153792766

1993 වර්ෂයේ සිට පැවත එන රු.15,000 ක මුදල් මාරු කිරීම් හා නිශ්චිතව කාලයක් සොයා ගත නොහැකි උපලබ්ධි නොවූ රු.10,104 ක්වු චෙක්පත් බැංකු ප්‍රකාශනයේ ශේෂයට එකතු කිරීම් ලෙස දක්වා තිබුණද, එම ශේෂයන් තහවුරු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබු ඇස්තමේන්තු ගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) වරිපනම් හා බදු | 74,620,000 | 83,379,116 | 75,566,342 | 43,887,616 | 68,515,000 | 62,750,199 | 71,289,402 | 36,074,841 |
| (ii) කුලී | 13,543,760 | 7,428,269 | 8,179,133 | 3,128,043 | 13,075,260 | 7,645,458 | 7,118,317 | 3,878,907 |
| (iii)බලපත්‍ර ගාස්තු | 850,150 | 462,250 | 462,250 | 43,450 | 720,100 | 396,750 | 395,500 | 43,450 |
| (iv)වෙනත් ආදායම් | 10,984,500 | - | 21,036,951 | - | 13,730,000 | - | 24,287,638 | - |

### 2.3.2 වරිපනම්

(i) ඉකුත් වර්ෂයේ හිඟ වරිපනම්, ප්‍රවර්තන වරිපනම් බිල් කිරීම හා දඩ ගාස්තු ඇතුළුව අයවිය යුතු රු.117,630,123 කින් වර්ෂය තුල රු.71,615,687 ක් අයකර ගෙන තිබුණු අතර අයවිය යුතු ශේෂය මුළු වරිපනම් වටිනාකමින් සියයට 39ක් විය.

(ii) රු.50,000 ට වඩා හිඟ හිටි රාජ්‍ය හා පෞද්ගලික අංශයේ දේපළවලින් 2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුළු හිඟ වරිපනම් වටිනාකම රු.23,589,748 ක් විය. මෙම හිඟය එදිනට පැවති මුළු හිඟයෙන් සියයට 65 ක් විය. සභාව විසින් මෙම හිඟ වරිපනම් ආදායම අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### 2.3.3 කුලී

(අ) කඩ කුලී

2017 දෙසැම්බර් 31 දිනට සුපිරි වෙළඳ සංකීර්ණයේ පිහිටි මුළු කඩ කාමර 37 න් 2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ කුලිය රු.157,800 ක් විය.

(ආ) නිවාස කුලී

සභාවට අයත් නිවාස සංකීර්ණ 02 ක පිහිටි නිවාස 15 කින් 2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුළු කුලී ආදායම රු.670,095 ක් විය. සභාව විසින් 2018 සැප්තැම්බර් 30 දිනට එම හිඟ මුදලින් රු.155,425 ක් අයකර ගෙන තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

නගර සභා ආඥා පනතේ 4වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය වැනි සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අත්හැර දැමූ කර්තව්‍යයන්

-------------------------------

සමාලෝචිත වර්ෂය තුලදී ඇස්තමේන්තුගත පිරිවැය රු.9,722,980 ක් වූ කර්මාන්ත 16 ක් අතහැර දමා තිබුණි.

(ආ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

(i) 2007 අංක 01 දරන බස්නාහිර පළාතේ අපද්‍රව්‍ය කළමනාකරණ රීතිවලට සභාව අනුගත වී නොතිබුණි.

(ii) සභාව විසින් මුතුරාජවෙල කසළ අංගනයට කසළ තෝරා බැහැර නොකිරීම හේතුවෙන් 2017 ජුලි 01 සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා කාලයට අදාලව මිශ්‍ර කසළ ටොන් 01කට රු.2,300 බැගින් රු.14,277,328 ක් වැඩියෙන් ගෙවිය යුතුව තිබුණි.

(iii) 2008 ජුලි 30 දිනැති අංක 1560/6 අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලද බස්නාහිර පළාතේ 2008 අංක 01 දරන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ රීතිවල 2වන පරිච්ඡේදයේ 18 (1) අනුව පළාත් පාලන ආයතනයට ගෙවනු ලබන බදුවලට අමතරව කසළ දොරින් දොරට එකතු කිරීමේ වියදම් පියවා ගැනීම සඳහා මාසික කසළ ගාස්තුවක් අයකර ගත යුතු වුවත් සභාව ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(iv) සභා සීමාව තුල වරිපනම් හිමි ව්‍යාපාරික ස්ථාන 8707 කින් අයවිය යුතු අවම භාවිත ගාස්තුව අයකලේ නම් 2017 වර්ෂය සඳහා රු.10,448,400 ක ආදායමක් අයකර ගත හැකිව තිබුණි.

(ඇ) පාරිසරික ගැටළු

-------------------

2017 වර්ෂයේදී බලප්‍රදේශයේ එකතුවන කසළ රජයට අයත් ඉඩමක එක්රැස් කර තෝරා මුතුරාජවෙල කසළ අංගනයට ප්‍රවාහනය කර තිබුණි. පසුව එම භූමිය අතහැර ඒ සඳහා වෙනත් ඉඩමක කසළ රැස්කර තිබුණු නමුත් පෙර පැවති ඉඩමේ ගොඩගැසී තිබුණු කසළ මුළුමනින්ම බැහැර නොකිරීම හේතුවෙන් මේවන විටත් පාරිසරික ගැටළු ඇති වී තිබුණි.

(ඈ) තිරසර සංවර්ධන ඉලක්ක

------------------------------

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත් වී නොමැති බව නිරීක්ෂණය විය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

(අ) සභාව විසින් 2017 වර්ෂයේ ජනවාරි සිට ඔක්තෝබර් දක්වා කාල සීමාව තුල ගොඩනැගිලි ඉදිකිරීමට, වෙනස් කිරීමට හෝ භාවිතය වෙනස් කිරීමට අදාලව නගර වැසියන් විසින් සභාව වෙත ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍ර 28ක් සඳහා 2018 සැප්තැම්බර් 30 දක්වා අනුමැතිය ලබා දී නොතිබුණි.

(ආ) සභාවට අයත් මහජන පුස්තකාලය හා කියවීම් ශාලා 02ක 2017 වර්ෂයේ සමීක්ෂණ වාර්තාව අනුව රු.129,000 ක් වූ අබලි හා ඉවත්කලයුතු පොත් 1043 ක් සහ රු.34,056 ක් වූ සමීක්ෂණයේදී හමුනොවූ පොත් 164 ක් වූ අතර අදාල පොත් ඉවත්කිරීමට හා අස්ථානගත වූ පොත්වල වටිනාකම වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ඇ) සභාවේ ගබඩා ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණු අතර මජීඩ් පෙදෙස සේවා පියස, සේදවත්ත දන්ත වාට්ටුව, සේද වත්ත සායනය හා වදුල්ල වත්ත කාය වර්ධන මධ්‍යස්ථානවල ඇති ඉන්වෙන්ට්‍රි භාණ්ඩ හා සවිකිරීම් ලේඛනගතකර නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත

-----------------------------------

(i) සභාවේ අනුමත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත පරිදි විය.

| තනතුරු වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| මාණ්ඩලික | 05 | 03 | 02 | - |
| ද්විතියික | 56 | 50 | 06 | - |
| ප්‍රාථමික | 291 | 310 | - | 19 |
| | 352 | 363 | 08 | 19 |

(ii) සභාවේ ලේකම් තනතුර සඳහා පරිපාලන සේවයේ III/II තනතුරක් අනුමත වී තිබුණද මේ දක්වා වෙනත් සේවාවන්වලට අයත් නිලධාරීන් එම තනතුරෙහි රාජකාරී ඉටුකිරීම සඳහා පත්කර තිබුණි. ගණකාධිකාරි හා පරිපාලන නිලධාරි තනතුරු පුරප්පාඩුව පැවතුණි.

(iii) සභාවේ ප්‍රාථමික තනතුරුවල සේවය කරන සේවකයින් 310 න් 129 ක් සෞඛ්‍ය කම්කරුවන්වන අතර එයින් 63 දෙනෙකු සෞඛ්‍ය අංශයට අයත් නොවන රාජකාරිවල යොදවා තිබීම නිසා සෞඛ්‍ය කම්කරුවන් බඳවා ගැනීමේ අරමුණු ඉටු වී නොතිබුණි.

(ආ) සේවක ණය

--------------

2017 දෙසැම්බර් 31 දිනට ස්ථාන මාරු වී ගිය නිලධාරින් 27 දෙනෙකුගෙන් රු.2,335,408 ක්ද විශ්‍රාම ගිය හා මියගිය නිලධාරින් 42 දෙනෙකුගෙන් රු.757,389 ක් ඇතුළුව රු.3,092,797ක් අයවිය යුතුව තිබුණි. 2018 සැප්තැම්බර් 20 දින වනවිට මින් රු.1,490,110 ක් අයකරගත යුතුව තිබුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------------

පොදු උපයෝගිතා සේවා සැපයීමේ අකාර්යක්ෂමතා

-----------------------------------------------------------

වසර 15 කට පමණ පෙර සභා බලප්‍රදේශයේ ස්ථාපිතකර ඇති පොදු නාන ස්ථාන 20 කට අදාලව මාසිකව රු.214,015 ක (බදු සහිත) ජල ගාස්තුවක් හා පෙර වර්ෂ හිඟයක් ඇතුළුව 2017 දෙසැම්බර් 31 දිනට රු.47,662,877 ක හිඟ ජල බිල්පතක් පැවතුණි. වර්තමානය වනවිට එකී පොදු නාන ස්ථාන බොහොමයක් ජලනල පහසුකම් සහිත නිවාසවල හා ව්‍යාපාරික ස්ථානවල පදිංචිකරුවන් විසින් පරිහරණය කිරීම සිදුවන බැවින් සභාව විසින් අනවශ්‍ය නාන ස්ථාන, හා ජලකරාම ඉවත් කිරීමට හෝ කළමනාකරණය කිරීමට කටයුතුකර නොතිබුණි.

3.5 අවිධිමත් ගනුදෙනු

---------------------

2014 වර්ෂයේදී ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සහ නගර සභාව එක්ව ක්‍රියාත්මක කල ආර්ථික සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් සභාවේ පරිපාලන වියදම් පියවා ගැනීම සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලබා දුන් රු.100,000 ක මුදලින් රු.95,000ක් සභාවේ ලේකම් සහ සභාපති ඇතුලු නිලධාරීන් 18 දෙනෙකු අතරේ බෙදා ගෙන තිබුණි.

3.6 වත්කම් කළමනාකරණය

-----------------------------

(අ) ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුලත්කර ඇති සභාවට අයත් අක්කර 43 රූඩ් 2 පර්චස් 36 ක ප්‍රමාණයක දැනට භාවිතා කරන දේපළ 28 ක් සම්බන්ධයෙන් සභාවේ හිමිකාරීත්වය ඔප්පු කිරීමට අදාල, හිමිකම් ඔප්පු පැවරුම් සහතික සභාව සතුව නොතිබුණි.

(ආ) රජයේ ප්‍රදානයක් ලෙස සභාවට ලැබී තිබුණු දහම්පුර ප්‍රජාශාලා ගොඩනැගිල්ල සහ ඒ තුල වූ භාණ්ඩ හා උපකරණවල අයිතිය සනාථ කිරීමට අදාල ලිඛිත සාක්ෂි සභාව සතුව නොතිබීම නිසා අලාභය අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) ගබඩා අයිතමයන් 16 ක් සම්බන්ධයෙන් බින් කාඩ් ශේෂය හා භෞතික තොග සත්‍යාපන වට්නාකම අතර රු.280,410 ක තොග ඌනතාවයක් පැවතුණි.

4. යහපාලනය හා ගිණුම් කටයුතු භාවය

-------------------------------------------

අයවැය පාලනය

------------------

සමාලෝචිත වර්ෂයට අයවැය ගත ආදායම් හා වියදම් සත්‍ය ආදායම් හා වියදම් අතර සියයට 50 සිට සියයට 100 දක්වා අසාමාන්‍ය විචලනයන් පැවති බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන ක්‍රමයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

(අ) වැය විෂයයන් 66ක් සඳහා සලසා තිබූ එකතුව රු.8,039,539.00ක ප්‍රතිපාදනය මුළුමනින්ම ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂයයන් 71ක් වෙනුවෙන් රු. 31,410,229 ක් වෙන්කර තිබුණද එයින් සියයට 50කට වඩා වැය නොකල මුදල රු.23,404,332 ක් විය.

6. පද්ධති හා පාලන

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
|---|---|
| (අ) ආදායම් පරිපාලනය | (i) හිඟ ආදායම් එකතු කිරීම ප්‍රමාණවත් නොවීම.<br>(ii) නව කුලී තක්සේරුව ක්‍රියාත්මක නොකිරීම. |
| (ආ) ගිණුම්කරණය | ගිණුම් වලින් අත්හැරීම්, ගිණුම්වල වැඩියෙන් හා අඩුවෙන් දැක්වීම් පැවතීම. |
| (ඇ) මූල්‍ය පාලනය | වර්ෂ ගණනාවක සිට පැවත එන උපලබ්ධි නොවූ චෙක්පත්, මුදල් මාරු කිරීම් නිරවුල් නොකිරීම. |
| (ඈ) තොග පාලනය | අවසන් තොග සමීක්ෂණය නොකිරීම. |
| (ඉ) කොන්ත්‍රාත් පාලනය | අත්හැර දැමීම් හා ප්‍රමාදවීම් පැවතීම. |